වසර 17 කට පෙර, සිය බිරිඳගේ නැගණිය ලිංගික අපයෝජනයට ලක් කළ අයෙකුට සිර දඬුවම් නියම වීමේ සිදුවීම, පුවත්පත් කිහිපයක් තුළ (සැප්තැම්බර් 21, 2033) ආවරණය වී තිබිණි.

එහිදී එම ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් පුවත් සිරස්තල තුළ සඳහන් වී තිබූ ආකාරයන් මෙසේය.

අරුණ, දිනමිණ -"දූෂණය"

අද -"අපයෝජනය"

දිවයින - "අතවර"

ඔබ සිතන ලෙසට,

1) "දූෂණය" වැනි යෙදුමක් ඔස්සේ ලිංගික අපරාධයක් හැඳින්වීමෙන්, එම ලිංගික අපරාධයට මුහුණ පෑ අය කිලිටි වී, අපවිත්‍ර වී ඇති බවට අදහසක් ගම්‍ය නොවන්නේද? එය ලිංගික අපරාධයන්ට ලක්වූවන් සම්බන්ධයෙන් සමාජය තුළ පවතින ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පය තවත් තීව්‍ර නොකරන්නේ ද?

2) ඒ අනුව මෙම පුවත් වාර්තාවන් අතරින්, වඩාත් යෝග්‍ය භාෂා භාවිතය ඇති පුවත් වාර්තාව(න්) ලෙසින් ඔබ තෝරා ගන්නේ කුමක්ද?

